# ධම්මපදය

## බාල වර්ගය (03 ගාථාව)

**03.** ගාථාව

**"පුත්තා මත්ථි ධනම්මත්ථි - ඉති බාලෝ විහඤ්ඤති,**

**අත්තා හි අත්තනෝ නත්ථි - කුතෝ පුත්තා කුතෝ ධනං."**

පදගතාර්ථය

| | | |
|---|---|---|
| **මෙ** | - | මට |
| **පුත්තා** | - | දරුවෝ |
| **අත්ථි** | - | ඇත්තාහ |
| **මෙ** | - | මට |
| **ධනං** | - | ධනය |
| **අත්ථි ඉති** | - | ඇත්තේ යැ යි (සිතමින්) |
| **බාලෝ** | - | අනුවණ තෙමේ |
| **විහඤ්ඤති** | - | තෘෂ්ණාවෙන් පෙළෙයි |
| **අත්තා හි** | - | තෙමේමත් |
| **අත්තනෝ** | - | තමාට |
| **නත්ථි** | - | නැත |
| **පුත්තා** | - | දරුවෝ |
| **කුතෝ** | - | කොයින් ද |
| **ධනං** | - | ධනය |
| **කුතෝ** | - | කොයින් ද |

භාවාර්ථය

මට පුතුන් ඇතැ යි, ධනය ඇතැ යි මෝඩයා වෙහෙසෙ යි. තමාහට තමා ද නැත. එවිට පුත්‍රයන් කොයින් ද? ධනය කොයින් ද?

නිදන කථාව

සැවැත් නුවර ආනන්ද නමින් ප්‍රසිද්ධ, සතළිස් කෙළක් ධනය ඇති තද මසුරුකමින් මැඩුණු සිටාණ කෙනෙක් විය. ඔහු අඩමසකට වරක් නෑයන් ගෙන්වා ගෙන 'මූලසිරි' නම් තම පුතු ඔවුන් ඉදිරියට පමුණුවා දවසකට තුන් විටක් ඔහුට "සතළිස් කෙළක් ධනය බොහෝ ය යි නො සිතන්න. තිබෙන දේ කාටවත් කිසිවක් දෙන්නට එපා. තව තවත් වැඩියෙන් සපයා ගන්න. දවසක් පාසා එක් එක් කහවනුව වුවත් වියදම් කළොත් නොබෝ දවසකින් සියල්ල ම අවසන් විය හැකි යි. ඒ නිසා නුවණැති මිනිසා ගැමෙන් අඳුන් අවසන් වන සැටිත්, වේයන් තුඹස් බඳින සැටිත්, මීමැස්සන් මීවද බඳින සැටිත්, දැක ධනය රැස් කර යි" යනුවෙන් අවවාද කර යි. මෙසේ කලක් ගෙවා ආනන්ද සිටු තෙමේ සිතට යටත් ව මසුරුමලින් මැඩි මැඩී මැරී ගොස් එනුවර අසල රොඩී-ගමෙක රොඩී-ගැහැණියක කුසෙහි පිළිසිඳ ගත්තේ ය. කොසොල් රජු මූලසිරි ගෙන්වා ඔහුට සිටු තනතුර දුන්නේ ය. ආනන්ද සිටුවරයා රොඩී-ගැහැණියගේ කුසෙහි පිළිසිඳගත් දිනයෙහි සිට එගම වැසියන්ට එදා වේලට වැඩියෙන් බත්වේලක් සපයා ගැනීමට නො හැකි විය. පසුව ගම්වැසියෝ අප අතර කාලකණ්ණියකු ඇතැ යි කතිකා කොට කොටස්වලට බෙදී බෙදී කාලකණ්ණියා පිළිසිඳගත් මව තෝරා ඇයව ගමෙන් පන්නාහැරියෝ ය. ඇය ද බොහෝ අපහසුවෙන් ජීවත් වී පුතා ද බිහි කළා ය. බිහි කළ පුතා ද අත්, පා, ඇස්, කන්, නාස්,

මුහුණු යනාදිය ඒ නියම තන්හි නො පිහිටි හෙයින් පාංශුපිශාචකයෙකු සේ පෙනෙන්නට විය. ඈ කැමට යමක් සපයා ගනු සඳහා පුත්‍රයා ද සමග බැහැර ගිය දවසක් වී නම් ඒ දවස කිසිත් නො ලැබ හිස්අතින් ම ගෙදරට එයි. පුතා නවතා ගිය සෑම දවසේ ම යමක් සපයාගෙන එයි. පසු ව ඒ දරුවාට ගෙන් ගෙට ගොස් ආහාර සොයා ගැනීමට පහසු වූ පසු ඔහුගේ මව කොළපතක් ඔහු අතට දී සිඟාගෙන ජීවත් වෙව'යි කියා ඔහුව පිටත් කළා ය. රොඩී-කොලුවා ද මව් කී ලෙසින් සිඟා යන්නේ පෙර අත්බව්හි ආනන්ද සිටු ව උපන් කාලයෙහි විසූ පෙදෙසට පැමිණ පෙර ජාති සිහි කිරීමෙහි නුවණ ලැබ, එකල විසූ ඒ ගෙදරට ම ගියේ ය.

සිටුනිවසෙහි දෙරකඩවල් තුනක් පසු කොට සතරවන දෙරකොටුවේ දී පාංශුපිශාචයා වැනි රොඩී-කොලුවා දකින්නා වූ මූලසිරි සිටාණන්ගේ පුත්‍රයෝ බිය වී හඬන්නට වූහ. එවිට සිටාණන්ගේ මෙහෙකරුවෝ ඔහු අල්ලා තළා, පෙළා කුණුගොඩට ඇද දැමූහ.

එදින බුදුරජාණන් වහන්සේ ආනන්ද මහතෙරුන් වහන්සේ සමග පිඩුසිඟා වඩින සේක්, කසළගොඩෙහි වැතිර සිටින්නා වූ රොඩීදරුවා ආනන්ද තෙරුන් වහන්සේට පෙන්වා සියලු තොරතුරු වදාළ සේක. ආනන්ද ස්වාමීන් වහන්සේ මූලසිරි සිටු ගෙන්වූහ. මිනිස්සු ද එහි රැස් වූහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "මහසිටුතුමනි, මේ කවරෙක් දැ'යි දන්නෙහි ද?" යි අසා වදරා "නො දනිමි" යි කී විට 'මොහු නුඹේ පියා වූ ආනන්ද සිටු තෙමේ ය'යි වදාළ සේක. එහෙත් මූලසිරි තෙමේ එය නො ඇදහී ය. බුදුරජාණන් වහන්සේ "ආනන්ද සිට, නුඹේ පුතුට මහානිදන පස තිබෙන තැන කියව" යි වදාළ සේක. එවිට ඔහු නිදන් තිබෙන තැන දැන්වී ය. පියා බැව් දැනගැනීමට එය ම හේතු විය. මූලසිරි සිටාණෝ සරණ-සීලයෙහි පිහිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔහුට ධර්මදේශනා කරමින් **"පුත්තා මත්ථි ධනම්මත්ථි"** යන ගාථාව දේශනා කළ සේක.

**ආත්මෝපදේශය** - දැඩි ආශාව පුද්ගලයා දුක්-අඳුර කරා ගෙන ය යි.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(නිකිණි 2553)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශිර්වාද පිණිස හා තමාට වහා චතුරාර්යසත්‍ය ධර්මය අවබෝධ කර ගැනීම පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දුයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**